# පූර්ණ මානසික බංකොලොත්බාවයක අග්‍ර ඵලය

ඩබ්.පී.ඩී.එස්. වැහිගල්දෙණිය

සිංහල පාඨකයාගේ මනා රස වින්දනය පිණිස මුල් කෘතියෙහි නුහුරු භාෂා ශෛලියට ම යට නොවී සිංහල ඌරුවට උචිත භාෂාවක් යොදා ගෙන පරිවර්තනය කරන ලද ''අසිරිමත් ලංකාව කෘතිය'' ජර්මානු බසින් සිංහලට නැගුවේ මහින්ද පතිරණ ලේඛකයා විසිනි. මහාචාර්ය විල්හෙල්ම් ගයිගර් 1895/1896 කාලයේ ලැබූ සීත ඍතුවේ දී ලක්දිවෙන් එකතුකරගත් රසබර අත්දැකීම් සමුදායක අස්වැන්නක් ලෙස Cylon Tagebuchblatter and Reiseerinnerungen නම් කෘතිය නිර්මාණය වී ඇත. පිටු 264කින් යුත් මෙම ග්‍රන්ථයේ සර්ම කලාපීය අහස යට ඵල දරන එම ජීවිත වල සුවිශේෂී ස්වභාවය ගෙන ඒමට දැරූ උත්සහයක අවසන් ඵලයයි.

අහස් කුස සිදුරු කළ උසම උස ගිරිශිඛර මත රැඳුණු සුදු පාට හිම වැස්ම ගෙවී ගිය ශීත ඍතුවේ උත්තමාචාරයක් වැන්න. සැඳෑ කල දම් පාට එළියෙන් සිතුවම් වූ එය චමත්කාර දසුනකි. දැන් අප නෙත් හමුවේ දිග හැරෙන්නේ යුරෝපයේ ඇති සුන්දරම දසුනයි. අපි හීපල් වරායේ ගතකළ රාත්‍රිය ඉතා සුවිශේෂී එකක් විය. සවස තේ හෝ කෝපි කෝප්පයකින් පසුව සියලු මිතුරු කණ්ඩායම් කැමති කැමති ක්‍රීඩාවල නියැලෙති. මෙම ක්‍රීඩා අතර 'ෂපල් බෝඩ්' ඉතා ජනප්‍රියය. මෙම ක්‍රීඩාව මට පෙනෙන්නේ පූර්ණ මානසික බංකොලොත් භාවයක ඵලයක් ලෙසය. ඕනෑම වර්ගයක ඔපාදූප කටගැස්මට ගන්නේ මෙතැනදීය. සියල්ලෝම අසුන්වලින් නැගිට තාරා නැටුම් බැලීමට රැස් වෙති. ඔවුහු අපට ආරාධනා කරති. තම පිහිනුම් හැකියාවට සාක්ෂි දරන ලෙස ඉල්ලා සිටිති. දුසිම් කිහිපයක් එහේ බලාපොරොත්තුව දල්වාගෙන අප දෙසට රැගුම් දක්වති. අයෙක් මූදට කාසියක් විසි කරති. සියල්ලෝම එය ගැනීමට මූදට පනිති. මුහුදු පත්ල පෙනෙන්නේ තව මොහොතක් පමණි. මෙම තරුණයින්ගේ පිහිනුම් ශූරතාව පුදුම එලවන සුළුය. මෙවන් රැගුම් පෙන්වීමට නම් අවශ්‍යයෙන්ම අමතර මුදල් ද ඕනෑ කෙරේ.
වන්දනාකරුවෝ සාමාන්‍යයෙන් කන්දෙති. උතුරු දෙසින් එය තරණය කරති. එය දුෂ්කර කාර්යයක් යැයි කියනු ලැබේ. අවසානයේ ම හමුවන ගල තැබිම සඳහා ඉනිමඟක ආධාරය ඕනෑ කෙරේ. කන්දෙහි දකුණු අතින් වැටී ඇති මාර්ගය වඩාත් අපහසුය. අයෙක් කලාතුරකින් ඒ මඟ භාවිතා කරයි. සති කිහිපයකට පසු පළමු වරට යලිත් පේරාදෙණියේ උද්‍යානයේ ඇවිදීමේ අවස්ථා වමට උදා විය. උයනෙහි සිත් පහන් කරන දසුන් මගේ ශාරීරික ශක්තිය වර්ධනය වීමට උපකාරී වුණි. එමෙන්ම නැවත සිරුරට ලැබෙන ජවය හා සුවය තව තවත් මා තුළ ඇවිදීමේ ආශාව වැඩි කළේය.

මහින්ද පතිරණ, අසිරිමත් ලංකාව, ප්‍රථම මුද්‍රණය, (2004) ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.